**මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදල - 2023**
---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලේ හඳුනානොගත් වියදම් ලෙස ඉකුත් වසරවල සිට පැවත එන රු.47,301,127 කට මිලදීගත් රසායනාගාර උපකරණ මේ වන විට භාවිතයට ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේදී මෙම උපකරණ, දේපල පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත නොකර ඉකුත් වර්ෂවල වියදම් ලෙස සමුච්චිත අරමුදලින් ගලපා තිබුණි. | ජ'නල් සටහනක් මඟින් නිවැරදි කර ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව සහ 2019 දී ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති මෙම චෙක්පත් බැංකු සැසඳුමෙහි හඳුනා නොගත් ගෙවීම් ලෙස වාර්තා කර තිබී 2023 වර්ෂයේ දී ගෙවීම් හඳුනා ගෙන ඇති බව. | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවන ලද එකතු වටිනාකම රු.1,919,484 ක් වූ වියදම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත නොකර, උපචිත වියදම් සඳහා ගෙවීමක් ලෙස සලකා ගලපා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු. 1,133,327 ක් වූ ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවන ලද වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී මෙවැනි දෝෂයන් සිදු නොවීමට වගබලා ගන්නා බව හා ජ'නල් සටහනක් මඟින් නිවැරදි කරන බව . | නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් පොතෙහි ශේෂයට සමාලෝචිත වර්ෂය දක්වා හඳුනා නොගත් ඍජු ප්‍රේෂණ ලැබීම් රු.9,989,864 ක් සහ හඳුනා නොගත් ගෙවීම් රු.1,474,211 ක් ගැලපීම් කර තිබුණද, ලැබීම් සහ ගෙවීම්වලට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ලැබීම් සහ ගෙවීම් සත්‍යාපනය කිරීමට නොහැකි විය. | හඳුනා නොගත් ලැබීම් සහ ගෙවීම් හඳුනාගැනිමට අපේක්ෂා කරන බව. | කඩිනමින් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | ස්ථාවර තැන්පතු සහතික අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 893,496,632 ක් වුවද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර තැන්පතු ලෙස රු.874,011,949 ක් දක්වා තිබුණෙන් එම ශේෂය රු.19,484,683 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ජර්නල් සටහන් මඟින් නිවැරදි කරන බව හා ඉදිරියේ දී මෙවැනි දෝෂ සිදු නොවීමට වග බලා ගන්නා බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම ලෙස රු. 120,876,722 ක් දක්වා තිබුණද, විගණනයේ ගණනය කිරීම් අනුව රු. 140,376,986 ක් | යොදා ගත් දින ගණන වැරදීම හේතුවෙන් මෙසේ සිදු වී ඇති අතර ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූයෙන් පොලී ආදායම රු.19,500,264 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ලෙස රු.24,618,273 ක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණ ද විගණනයේ ගණනය කිරීම් අනුව ලැබිය යුතු පොලී ආදායම රු.27,539,122ක් වූයෙන් එය රු.2,920,849 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස රු.4,493,637 ක් වෙන්කර තිබුණද, ඉදිරි වර්ෂයේ වවුචර් පරීක්ෂාවේදී උපචිත වියදම් එකතු වටිනාකම රු. 7,052,334 ක් වූයෙන් රු. 2,558,697 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (උ) | එකතු කල අගය මත ගෙවිය යුතු රු.5,970,781 ක බදු මුදල, භාණ්ඩාගාරයට ගෙවිය යුතු ආදායම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගෙවීම් නිසි පරිදි සිදු වුවත් මුදල් පොතේ ලිවීමේදී වැරදීමකින් මෙම අගයන් දෙක මාරු වී ලියවී ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1995 අංක 35 දරන මිනුම් ඒකක ප්‍රමිත හා සේවා පනතේ 20 (1) (අ) සහ 37 වගන්තිය | වෙළඳාමේ භාවිතා වන සියලුම මිනුම් උපකරණ වාර්ෂිකව සත්‍යාක්ෂණය කලයුතු වුවත් භාවිතා කරනු ලබන සෑම උපකරණයක්ම සත්‍යාක්ෂණය කරන බව තහවුරු කර ගැනීමේ නිසි ක්‍රමවේදයක් අරමුදල තුල මේ දක්වා ස්ථාපිත කර නොතිබුණි. | සියළුම මිනුම් උපකරණ සඳහා ලියාපදිංචි අංකයක් ලබා දි විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර එහි ප්‍රගතිය මීලග විගණනයේදි වාර්තා කිරීමට කටයුතු කරනු ලබන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව නිලධාරීන් 04 දෙනෙකුට රු.100,000 ඉක්මවා එකතුව රු.900,000 ක් වූ ඉන්ධන අත්තිකාරම් ලබා දී තිබුණි. | 2024 වර්ෂයේදී රු.100,000 සීමාව ඉක්මවා නොයන ලෙස කටයුතු කරන බව . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/ 2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | රජයේ වාහන සෑම ඉන්ධන දහන පරීක්ෂාවකට පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසු හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහන පරීක්ෂාවක් සිදුකල යුතු වුවද දෙපාර්තමේන්තුවේ ඇති වාහන 13 ක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට සැළසුම් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 165,955,538 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 75,092,226 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 90,863,312ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමස්ථ ආදායම රු. 137,377,208කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ විදුලි සෝපාන 02 ක් සේවාකරණය සහ නිසි ප්‍රමිතියෙන් නඩත්තු කිරීම සඳහා 2022 නොවැම්බර් 01 දින සිට 2023 ඔක්තෝබර් 31 දින දක්වා වසරක කාලයකට පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී තිබුණද, ගිවිසුම්ගත දින සිට මාස 08 ක කාලයක් ගිවිසුම්ගත මුදල වූ රු.1,038,318 ක් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් අදාල ගිවිසුම ප්‍රකාරව විදුලි සෝපාන යන්ත්‍ර 02 සඳහා සේවා වාර 08 බැගින් සේවා වාර 16 ක් මඟ හැරී තිබුණි. | තාක්ෂණික කමිටුව විසින් උපදෙස් නොතකා කටයුතු කිරීම හේතුවෙන් එම කමිටුව වෙනස්කිරීමටද සිදු වූ බව. | වියදමට අදාළ සේවාව ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල වායුසමීකරණ යන්ත්‍ර 79 කට අදාලව සේවාකරණ ගිවිසුම්වලට එළඹී නොතිබීම හේතුවෙන් වර්ෂයක් වැනි කෙටි කාලයක් තුල යන්ත්‍ර කිහිප වරක් අලුත්වැඩියා කිරීම් සිදු කර තිබුණු අතර 2023 වර්ෂයේ වාර 36 ක් තුළ වායු සමීකරණ යන්ත්‍ර සඳහා රු. 2,137,590 ක අලුත්වැඩියා වියදම් දරා තිබුණි. | සියලුම වායු සමීකරණ යන්ත්‍ර සේවා කිරීමට හා අක්‍රියව පවතින යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කරවා ගැනීමට කටයුතු කරන බව. | වියදම් මනාව කළමනාකරණය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 වර්ෂය තුළ අංක HH –7294 දරන රථය අපහරණය කර මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ තාක්ෂණික කටයුතු සඳහා යොදාගැනීමට කටයුතු කර තිබූ නමුත් එම රථයේ ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත ආකෘති පත්‍ර සම්පූර්ණ කර යවා නොතිබුණි. | ඒ පිළිබඳව ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන බව | ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කාර්තු 04 තුල ළඟාකර ගතයුතු භෞතික ඉලක්ක ප්‍රතිශතයක් ලෙස දක්වා තිබුණු අතර වසරකට කිරීමට ඇති ප්‍රමාණාත්මක සංඛ්‍යාවක් දක්වා නොතිබුණි. ඇතැම් ක්‍රියාකාරකම් සඳහා පසුගිය වර්ෂයේ ඉලක්කයන්ම ලබාදී තිබූ අතර වර්ෂය තුල කල වැඩ ප්‍රමාණය මත ප්‍රගතිය ලබාගෙන ඇති බව නිරීක්ෂණය විය. | 2024 වර්ෂයේ සිට ප්‍රමාණාත්මකව දැක්විය හැකි ක්ෂේත්‍ර සියල්ල හඳුනාගෙන ඉලක්ක ප්‍රමාණාත්මකව ලබා දීමට කටයුතු කර ඇති බව. | ඉලක්ක නිශ්චිතව දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ආ) | උපකරණ නිෂ්පාදකයින්, ආනයනකරුවන්, විකුණුම්කරුවන්, අලුත්වැඩියාකරුවන් ලියාපදිංචි කර ගැනීමේ ඉලක්කගත ප්‍රමාණය හා ආදායම ලබාගැනීම පිළිවෙලින් ඒකක 600 ක් සඳහා රු. මිලියන 15 ක් වුවද සත්‍ය ප්‍රමාණය හා සත්‍ය ආදායම පිළිවෙලින් ඒකක 148 ක් හා රු.මි 0.69 ක් වී තිබුණි. මේ අනුව ඉලක්ක ගත ප්‍රමාණයේ සත්‍ය කාර්ය සාධනය සියයට 25 ක් පමණක් වී තිබුණි. | සාමාන්‍ය පරිදි පවත්නා 600 ක ඉලක්කයට අදාල ප්‍රමාණය සැලකීමේදී 2023 වර්ෂයේදී, එම ලියාපදිංචි සහතික ප්‍රමාණය කලින් වර්ෂයේදී මෙන්ම 2024 වර්ෂයට අදාල සහතික 2023 දෙසැම්බර් මස වන විට නිකුත් කිරීමට නොහැකි වීම මත අඩුවෙන් නිකුත් කර නොමැති බව හා ඉලක්කයට ළඟා වී ඇති බව. | ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික්ක 12 ක් තුල මිනුම් ප්‍රමිතීන් නැවත සත්‍යාපනය කිරීමට සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල දිස්ත්‍රික්ක 05 ක පමණක් එම කාර්යය ඉටුකර තිබිණි. | පිළිගනිමි. | ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | දක්ෂ හා උගත් ප්‍රජාවක් ඇති කිරීම සඳහා මිනුම් දැනුම ව්‍යාප්ත කිරීම හා අන්තර් ආශ්‍රිත ආයතන අතර පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රදර්ශන පැවැත්වීම් සමාලෝචිත වර්ෂයේදී කොපමණ ප්‍රමාණයක් ඉටු කරනු ලබන්නේද යන්න සැලසුම්කර නොතිබුණු අතර ඒ යටතේ ප්‍රදර්ශන 02 ක් පමණක් පවත්වා තිබුණි. | පිළිගනිමි. | ඉලක්ක නිශ්චිතව දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ආයතනික රාමුව ශක්තිමත් කිරීමේ පරමාර්ථය යටතේ මිනුම් ඒකක ප්‍රමිති සේවා පනත හා නීති රීති යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය සියයට 35 ක් වී තිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කර ගැනීමට නොහැකි වූ ඉලක්කයන්හි ආයතනික රාමුව ශක්තිමත් කිරීමේ පරමාර්ථ යටතේ ප්‍රධාන වශයෙන් මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා පනත යාවත්කාලීන කිරීමේ ප්‍රගතිය සියයට 35 ක් ලෙස සඳහන්ව ඇති බව. | ආයතනික නීති රීති යාවත්කාලීව පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඊ) | සංවර්ධන හා පර්යේෂණ කටයුතු යටතේ මිනුම් විද්‍යා පරීක්ෂණ නිලධාරීන් 09 දෙනෙකුට පර්යේෂණ ව්‍යාපෘති 08 ක් භාරදී තිබු අතර එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුල අවසන් කිරීමට සැලසුම් කර තිබුණද අදාළ ව්‍යාපෘති කටයුතු නිශ්චිත හේතු දැක්වීමකින් තොරව 2024 වර්ෂය දක්වා දීර්ඝ කර ගෙන තිබුණි. | පුරප්පාඩු පිරවීමෙන් පසු මාස 06 ක් තුළ මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට තීරණය කර ඇති බව. | සංවර්ධන හා පර්යේෂණ කටයුතු කාර්යයක්ෂමව ඉටු කිරීමට කටයුතු කල යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල ආයතනයේ වාහනවල වාරානුකූල සේවා වාර 26 ක් සඳහා රු. 1,198,432 ක වියදම් දරා තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි 3.4 වගන්තිය අනුව සුළු වටිනාකමක් ඇති වැඩ හෝ සේවා ලබා ගැනීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන් අතරින් හෝ දුරකථන නාමාවලියේ කහ පිටු අතරින් තෝරාගත් සැපයුම්කරුවන්ගෙන් ලබාගත් ලංසු 03ක් හෝ 05 ක් අතරින් ඇගයීම් කර තෝරාගත් ලංසුකරුවන්ගෙන් අදාල සේවාව ලබා ගැනීමට කටයුතු නොකර සේවා වාර 17ක් එකම සේවා ස්ථානයකින් සිදුකර රු.827,570ක මුදලක් ගෙවා තිබුණි. | පිළිගනිමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර කාමර 66ක් සහිතව 2015 සිට ජාතික මිනුම් පර්යේෂණාගාරය පිහිටුවා තිබුණද වර්තමානයේ මිනුම් ක්ෂේත්‍ර 12 ක් සඳහා විද්‍යාගාර කාමර 33 ක් පමණක් ක්‍රියාකාරීව පවත්වාගෙන යන අතර ඉතිරි කාමර 33 ක් (වර්ග අඩි 140,060 ප්‍රමාණයක්) විගණිත දින දක්වා නිෂ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය. | දැනට විද්‍යාගාරයේ කාමර 20ක් වායු සමීකරණ යන්ත්‍ර යොදාගෙන පර්යේෂණාගාර පවත්වාගෙන යන අතර අනෙකුත් පර්යේෂණ කාමර වායු සමීකරණ පද්ධතියක් හා වාතාශ්‍රය නොමැතිව පවත්වාගෙන යා නොහැකි බව. | වත්කම් ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |